**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -I කොටස - 2018**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - I කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 දෙසැම්බර් 23 දින එළඹි අංක. පීබීසී අංක. (2014) 27 එකතු අංක. 321 හා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක. පීබීසී අංක. (2014) 27 එකතු අංක. 321 ඒ(1) දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ජාත්‍යාන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සමස්ථ පිරිවැය රු.මිලියන 103,280 කට සමාන එ.ජ.ඩො. මිලියන 804.11 වූ අතර එයින් රු.මිලියන 87,788 කට සමාන එ.ජ.ඩො. මිලියන 683.49 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 15,492 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 18 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.**

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීමේ ප්‍රමාදයන් සඳහා ගෙවිය යුතු රු. මිලියන 99.41 පොලිය සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවල මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැපයිය යුතුය. |
| (ආ) | කෙරීගෙන යන වැඩවල ඇතුළත් රු. මිලියන 492.89 ක් වටිනා ස්ථාවර වත්කම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත අයිතමයන් අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල තත්‍ය ඉදිකිරීම් පිරිවැය පෙන්වීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය මාස 26 ක ප්‍රමාදයකින් යුතුව 2016 ජනවාරි 19 දින සිය කටයුතු ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 වන විට සියයට 93 ක් වූ අපේක්ෂිත ඉලක්කවලට සාපේක්ෂව සියයට 87 ක් ලෙස පැවතුණි. උපදේශකවරයා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉඩම් අත්පත් | කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දින සිට මාස 26 ක් ප්‍රමාද වී ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, ණය ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ආරම්භක දිනය නියම කරනු ලබන අතර ඒ අනුව ව්‍යාපෘතියේ ආරම්භක | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කර ගැනීම සහ සවිස්තරාත්මක සැලසුම් කටයුතු සකස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාණ පත්‍ර අයිතම 21 ක සියයට 0 සිට සියයට 40 දක්වා වූ මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය විය. තවද, අධිවේගී මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ප්‍රවේශ පහසුකම් අහිමි වූ ගම්වැසියන් සඳහා රු. මිලියන 1,283 ක ඇස්තමේන්තුගත වියදමින් මාර්ග 110 ක් ඉදිකිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 31 වන දින දක්වාත් ආරම්භ කර නොතිබුණි. | දිනය 2016 ජනවාරි 19 ලෙස නියම කරන ලදී. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 85,530ක් වූ නමුත් එය රු.මිලියන 103,280 කට ප්‍රදානය කර තිබුණු අතර පසුව එය රු.මිලියන 113,589 ක් ලෙස සංශෝධනය කර තිබුණි. තවද, රු.මිලියන 39,937 ක් වූ කුලුණුමත ඉදිකළ කොටසේ සහ පාලම්වල පිරිවැය රු.මිලියන 58,725 ක් දක්වා වැඩිවී තිබුණි. | විස්තරාත්මක විමර්ශන වලදී අනපේක්ෂිත භූමි තත්වයන් හමුවීම, සවිස්තරාත්මක සැලසුම්වලදී හඳුනාගත් අමතර වැඩ ප්‍රමාණ සහ වැඩබිමේ අවශ්‍යතා මත ක්‍රියාත්මක කරන ලද නව වැඩ කොටස් හේතුවෙන් මුල් කොන්ත්‍රාත්තු මුදල සියයට 10 කින් වැඩිවී තිබුණි. | වෙනස්කම් අවමවන පරිදි ප්‍රමාණ පත්‍ර සකස් කළ යුතුය. |
| (ආ) | ලැබුණු තොරතුරු වලට අනුව, රජයේ ඉඩම් කැබලි 1,406 ක් ඇතුළුව ඉඩම් කැබලි 4,790 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබුණි. එයින් ඉඩම් කැබලි 4,098 ක් සඳහා වන්දි මුදල් ලෙස 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,636.20 ක් ගෙවා තිබුණි. | සමහර හිමිකාරිත්ව ඇගයීම්වල සංකීර්ණත්වය, කාර්යයන් තාවකාලිකව අත්හිටුවීම සහ භාණ්ඩාගාරයෙන් අරමුදල් මුදා හැරීමේ ප්‍රමාදයන් | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**තවද, වන්දි ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 11.80 ක පොලී මුදලක් ගෙවා තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා දිරි දීමනා සහ අනෙකුත් වියදම්වලට අමතරව රු. මිලියන 30.7 ක් 2018 වර්ෂය තුළ වැය කර තිබුණි. ක්‍රියාවලියේ ප්‍රමාදයට හේතු විය.**